# ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
# இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
# HUMAN RIGHTS COMMISSION OF SRI LANKA

| | | |
|---|---|---|
| මගේ අංකය<br>எனது இல.<br>My No. | ඔබේ අංකය<br>உமது இல.<br>Your No. | දිනය<br>திகதி<br>Date 2026.06.15 |

කලුගල ප්‍රියනුවන් පීරිස්,
නො 300/1,
ඩී. සැන්ටින් ද සොයිසා මාවත,
කුලීගොඩ,
අම්බලන්ගොඩ.

*පැමිණිලිකාර පාර්ශවය*

කේ.දිල්නුක වින්දිව් (අවුරුදු 11) ,
ගා/පී. ද එස්. කුලරත්න විද්‍යාලය,
7-ඩී ශ්‍රේණිය.

*වින්දිත පාර්ශවය*

*එදිරිව*

1. සුමිත් ප්‍රියන්ත හෙන්දහේවා මයා ,
   7-ඩී ශ්‍රේණිය විද්‍යා විෂය භාරගුරු,
   ගා/පී. ද එස්. කුලරත්න විද්‍යාලය,
   අම්බලන්ගොඩ.

2. එච්.ඒ. රේණුකා සුදර්ශනී මිය,
   7 ඩී ශ්‍රේණිය- පන්ති භාර ගුරු,
   ගා/පී. ද එස්. කුලරත්න විද්‍යාලය,
   අම්බලන්ගොඩ

3. විදුහල්පති,
   ගා/පී. ද එස්. කුලරත්න විද්‍යාලය,
   අම්බලන්ගොඩ.

4. ස්ථානාධිපති,
   කාන්තා හා ළමා කාර්යාංශය,
   පොලිස් ස්ථානය,
   අම්බලන්ගොඩ.

5. අධ්‍යක්ෂ,
   කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ,
   අම්බලන්ගොඩ.

*වගඋත්තර පාර්ශවය*


| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| ප්‍රධාන කාර්යාලය<br>பிரதான அலுவலகம்<br>Head Office | අංක 14, ආර්. ඒ. ද මෙල් මාවත, කොළඹ 04.<br>இல. 14, ஆர். ஏ. த. மெல் மாவத்தை, கொழும்பு 04.<br>No. 14, R. A. De Mel Mawatha, Colombo 04. | සභාපති<br>தவிசாளர்<br>Chairman | 011 - 250 5451 | ෆැක්ස්<br>தொலைநகல்<br>Fax | 011 - 250 5541/74 | ඊමේල්<br>மின்னஞ்சல்<br>E-mail | sechrcsl@gmail.com |
| දුරකථනය<br>தொலைபேசி<br>Telephone | 94-11-2505580 / 81 / 82 | ලේකම්<br>செயலாளர்<br>Secretary | 011 - 250 5521 | ක්ෂණික<br>துரித அழைப்பு<br>Hotline | 1996 | වෙබ්<br>இணையம்<br>Web | www.hrcsl.lk |

**<u>පැමිණිලි අංකය - HRC/HO/1086/26</u>**

**පැමිණිල්ල**

පැමිණිලිකරු 2026.03.16 දින මානව හිමිකම් කොමිෂන් සභාව වෙත පැමිණිල්ලක් යොමු කරමින්, අම්බලන්ගොඩ ගා/පී. ද එස්. කුලරත්න විද්‍යාලයේ 7-ඩී ශ්‍රේණියේ ඉගෙනුම ලබන 11 හැවිරිදි වියේ පසුවන කළුගල දිල්නුක වින්දිව් යන සිය පුතාට, 2026 මාර්තු මස 12 වන දින විද්‍යා විෂය භාර සුමිත් ගුරුවරයා විසින් විද්‍යාගාරය තුළදී විද්‍යා විෂය නිර්දේශයට අදාළ පෙළපොත් එදින රැගෙන නොපැමිණි බවට චෝදනා කරමින්, දරුවාගේ සාධාරණ කරුණු දැක්වීම් ද නොතකා, වේවැලකින් අත් දෙකෙහි වැලමිට ප්‍රදේශයට පහර දී ඇති බවත්, මෙම පහරදීම අනෙකුත් සිසුන් ඉදිරියේ සිදු කරන ලද ක්‍රියාවක් බවත් සඳහන් කර ඇත.

වින්දිත දරුවා පාසල අවසානයේ නිවසට පැමිණ සිද්ධිය පිළිබඳව පැමිණිලිකරු වෙත පවසා ඇති කරුණු පහත පරිදි වැඩිදුරටත් සඳහන් කර ඇත.

*"තාත්තෙ මට විද්‍යාව උගන්නන සුමිත් සර් විද්‍යාගාරෙ ඇතුලෙ ලමයි ඉස්සරහා හොදටම ගැහුවා.මට ආයෙ ඉස්කෝලෙ යන්න බෑ. කථා කරන්න ඉඩක් තිබ්බෙ නෑ.මම වරදක් කලේ නෑ. ඕනෙ නම් ලමයින්ගෙන් අහන්න තාත්තෙ.මට පොත ගේන්න එපා කිව්වෙ සුමිත් සර්මයි. ඒත් මගෙන් පොත කෝ අහල හොදටම ගැහුවා.මම ළමයෙක්ව තුවාල වෙලා එයාව බෙහෙත් දාන්න එක්කන් ගිහින් එනගමන් විද්‍යාව සර් හම්බුනා සර් ඇහුව කොහිද යන්නෙ කියල මම කිව්ව මේ ළමයට බෙහෙත් දාල එනගමන් සර් මම විද්‍යාව පොත් දෙක ගේන්න යනවා සර් කිව්වම, සර් කිව්ව පොත් දෙක ඕනේ නෑ අද මුකුත් ලියන්නෙ නෑ කියල කිව්වා. සසන්ටත් ඒක ඇහුනා.ඊට පස්සෙ මමයි තුවාල උනු ළමයයි විද්‍යාව විෂයට විද්‍යාගාරයට ගියා. එතනට විද්‍යාව සර් ඇවිත් ඊයේ රූප සටහන ඇන්දද කියල හැමෝගෙන්ම ඇහුවා. අහලා වේවැල අතට ගත්තා. ඊට පස්සෙ මගේ ඉදලා ඒ වැඩේ බලන්න පටන් ගත්ත. සර් මගෙන් රූප සටහන කෝ කියල ඇහුවා. ඊට පස්සෙ මම පොත නෑ ගේන්නද සර් කියලා කියනවා එක්කම සර් මට බැන බැන අත් දෙකේ වැලමිටට උඩින් පාරවල් හිටිනකන් රතු වෙලා ඉදිමෙනකන් ගැහුවා. ගිහිං පොත් ගෙනෙං කියල පොත ගේන්න යනකොටත් ආයෙන් ගැහුවා. තාත්තේ මගේ අත් දෙක කැක්කුමයි. දැවිල්ලයි. මාව ඉස්පිරිතාලෙට ගෙනියන්න තාත්තේ. මම ඉස්කෝලෙදී ඉස්පිරිතාලෙට ගෙනියන්න කිව්වෙ නෑ සර්ට බයට. මට ගහපු වෙලේ පංතිභාර සුදර්ශනි ටීච අයිස් කැට අරං ඔය තුවාලෙට තියාගන්න කිව්වා තාත්තේ. යාලුවොත් කිව්ව මට අයිස් කැට තියාගන්න කියල. යාලුවොන්ටත් ඇඩුනා මට ගහපු ගැහිල්ලට තාත්තේ"*

පැමිණිලිකරු වැඩිදුරටත් කරුණු දක්වමින්, මෙම පහරදීම සම්බන්ධයෙන් පන්ති භාර සුදර්ශනී ගුරුවරිය දැනුවත්ව සිට ඇති බවත්, දරුවාගේ ඉදිමී ගිය තුවාල සඳහා ඇය විසින් අයිස් කැට තැබීමට උපදෙස් දී ඇති නමුත්, සිසුවාගේ බරපතල තත්ත්වය සලකා දරුවා රෝහල් ගත කිරීමට හෝ ඒ පිළිබඳව දෙමාපියන් දැනුවත් කිරීමට ඇය කටයුතු කර නොමැති බව සඳහන් කර ඇත. විද්‍යාලයේ විදුහල්පතිවරයා මෙම සිදුවීම සම්බන්ධයෙන් මුලදී නිසි අවධානයක් යොමු නොකළ ද, පසුව දෙමාපියන් සමඟ සිදු වූ දුරකථන සංවාදයකදී අදාළ ගුරුවරයාගේ හැසිරීම අමානුෂික බව පිළිගෙන ඇති බවත්, එම ගුරුවරයා ද සිය වරද විදුහල්පතිවරයා ඉදිරියේ පිළිගෙන ඇති බවත්ය. මෙම කරුණු සනාථ කිරීම සඳහා විදුහල්පතිවරයා සහ පන්ති භාර ගුරුවරිය සමඟ සිදු වූ සංවාද ඇතුළත් හඬපට සාක්ෂි වශයෙන් ඔහු විසින් ඉදිරිපත් කර ඇත.

සිද්ධියෙන් අනතුරුව දරුවා බලපිටිය මූලික රෝහලට ඇතුළත් කර ඇති අතර, එහි පළමු වාට්ටුවේ නේවාසිකව ප්‍රතිකාර ලබා ඇත. මෙම ක්‍රියාව සම්බන්ධයෙන් 2026.03.12 වන දින අම්බලන්ගොඩ පොලිස් ස්ථානයේ ළමා හා කාන්තා කාර්යාංශය වෙත WCIB 135/89 අංකය යටතේ පැමිණිලි කර ඇති අතර, 2026.03.13 වන දින අධිකරණ වෛද්‍ය නිලධාරිනිය විසින් දරුවාව පරීක්ෂාවට ලක් කර තිබේ. දරුවාගේ අත්වල පවතින තුවාල කැළැල් තවදුරටත් දක්නට ලැබෙන බවත්, සිද්ධිය සම්බන්ධයෙන් අධිකරණමය ක්‍රියාමාර්ග සඳහා යොමු වී ඇති බවත් සඳහන් කර ඇත.

තව ද අදාළ ගුරුවරයාගේ මෙම හැසිරීම් රටාව පන්ති කාමරයේ අනෙකුත් සිසුන් කෙරෙහි ද බලපෑමක් එල්ල කර ඇති බවත්, පන්තියේ අනෙකුත් සිසුන්ට ද ඔහු විසින් විවිධ ආකාරයේ පහරදීම්

සහ ගෙලෙන් අල්ලා තෙරපීම වැනි දඬුවම් පමුණුවා ඇති බවට සිසුන් සාක්ෂි දරන බව ද පැමිණිල්ලේ දැක්වේ. පන්ති භාර ගුරුවරිය සමඟ සිදු කරන ලද විනාඩි 45ක සංවාදයේ හඬ පටය ඇතුළුව සියලුම ඩිජිටල් සාක්ෂි කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරමින්, දරුවාගේ මූලික අයිතිවාසිකම් උල්ලංඝනය කිරීම සම්බන්ධයෙන් අදාළ ගුරුවරයා සහ අනෙකුත් බලධාරීන්ට එරෙහිව ක්‍රියාමාර්ග ගන්නා ලෙස ඉල්ලීම් කර ඇති අතර, මෙම සිද්ධිය සම්බන්ධයෙන් කිසිදු ආකාරයක සමථයකට එළඹීමට සූදානම් නොමැති බවද වැඩිදුරටත් සඳහන් කර ඇත.

<u>වගඋත්තරකරුවන්ගේ කරුණු දැක්වීම</u>

**01. පළමු වගඋත්තරකරු : සුමිත් ප්‍රියන්ත හෙන්දහේවා මයා (විද්‍යා විෂය භාර ගුරු)**

2026.04.28 වන දින මානව හිමිකම් කොමිෂන් සභාවේ දී පවත්වන ලද විමර්ශනයේදී ප්‍රකාශයක් ලබාදෙමින්, අදාළ සිද්ධිය සිදුවන අවස්ථාව වන විට ඔහු ගා/පී. ද එස්. කුලරත්න විද්‍යාලයට පත්වීම් ලබා පැමිණ සති තුනක පමණ කෙටි කාලයක් ගතවී තිබූ බව සඳහන් කර ඇත. එසේම මෙම සිද්ධිය වූ දින පන්ති කාමරයේ සිටි සිසුන් විද්‍යාගාරය වෙත රැගෙන යන අවස්ථාවේදී, තරප්පු පෙළ අසලදී සිසුන් තිදෙනෙකු මුණගැසුණු බවත්, ඉන් එක් සිසුවෙකු තුවාල ලබා ප්‍රතිකාර සඳහා යන බව දැනගත් පසු, තුවාල ලැබූ සිසුවා හැර සෙසු සිසුන්ට විද්‍යා විෂයට අදාළ පොත් රැගෙන එන ලෙස ඔහු උපදෙස් දුන් බවත් ප්‍රකාශ කර ඇත. කෙසේ වුවද, එම අවස්ථාවේදී ඔහු ලබාදුන් පණිවිඩය සිසුන් වෙත නිවැරදිව සන්නිවේදනය වූයේද යන්න පිළිබඳව ගැටලුවක් පවතින බව ද වැඩිදුරටත් සඳහන් කර ඇත.

එදින විද්‍යාගාරය තුළදී පැවරුම් පරීක්ෂා කිරීමේදී, වින්දිත සිසුවාගෙන් පොත් විමසන අවස්ථාවේ විද්‍යාගාරයේ තිබූ වේවැල් කැබැල්ලක් අතට ගෙන එය වැනීමේදී අචේතනිකව (නොදැනුවත්ව) සිසුවාගේ ශරීරයේ වැදුණු බව වගඋත්තරකරු සඳහන් කර ඇත. සිසුවා කෙරෙහි කිසිදු පෞද්ගලික වෛරයකින් හෝ සචේතනිකව පහරදීමක් සිදුකිරීමේ අදහසකින් තමා කටයුතු නොකළ බවත්, මෙම අහම්බයකින් සිදු වූ සිදුවීම පිළිබඳව සිය කණගාටුව පළ කරන බවත් වැඩිදුරටත් ප්‍රකාශ කර ඇත.

වගඋත්තරකරු, 2026.05.02 දිනැති දිවුරුම් ප්‍රකාශයක් මගින් වැඩිදුරටත් කරුණු දක්වමින්, ඔහු වසර 32කට අධික දීර්ඝ සේවා කාලයක් සහිත ගුරුවරයෙකු බවත්, 1994 වසරේ සිට පාසල් අටක (08) සේවය කර ඇති බවත්, කිසිදු අවස්ථාවක පෞද්ගලික උපකාරක පන්ති පවත්වා නොමැති බවත්, පාසල් කාලයෙන් පසු පවත්වන ප්‍රතිපෝෂණ වැඩසටහන් සඳහා ස්වේච්ඡාවෙන් දායක වූ බවත් ප්‍රකාශ කර ඇත. ඔහු ඉගැන්වූ පාසල්වල සාමාන්‍ය පෙළ විද්‍යා විෂය ප්‍රතිඵල 97% දක්වා ඉහළ මට්ටමක පවත්වා ගැනීමට හැකි වූ බවත්, ඒ හේතුවෙන් දකුණු පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය මගින් පිදෙන 'සිසු තරණ ගුරු උපහාර' සම්මානයෙන් කිහිපවරක්ම පිදුම් ලබා ඇති බවයි.

තව ද වර්තමානයේ අම්බලන්ගොඩ අධ්‍යාපන කලාපයේ විද්‍යා විෂය සම්පත් දායකයෙකු ලෙසත්, නව විෂය නිර්දේශ ප්‍රතිසංස්කරණ පුහුණුකරුවෙකු ලෙසත් කටයුතු කරන තමාගේ දීර්ඝ සේවා කාලය තුළ මෙතෙක් කිසිදු විනය විරෝධී ක්‍රියාවක් සම්බන්ධයෙන් චෝදනා එල්ල වී නොමැති බවයි. තමා තිදරු පියෙකු බවත්, සිය දරුවන් සේම තමා යටතේ ඉගෙනුම ලබන සිසුන්ද සමාජයේ යහපත් පුරවැසියන් කිරීමේ පරම අභිලාෂයෙන් කටයුතු කරන බවත්, 2026.03.12 දින සිදු වූ සිදුවීමේදී තමා ක්‍රියා කළේ ශිෂ්‍යයා කෙරෙහි වූ සත්භාවයෙන් මිස ශාරීරික තුවාල හෝ පීඩා කිරීමේ අරමුණින් නොවන බව ද වැඩිදුරටත් සඳහන් කර ඇත.

**02. දෙවන වගඋත්තරකාරිය : එච්.ඒ. රේණුකා සුදර්ශනී මිය (පන්ති භාර ගුරු)**

2026.04.28 වන දින මානව හිමිකම් කොමිෂන් සභාවේ දී පවත්වන ලද විමර්ශනයේදී කරන ලද ප්‍රකාශය සහ 2026.04.27 දිනැති ලිපියේ කරුණු දැක්වීම මගින්, ඇය වසර 36ක දීර්ඝ සේවා කාලයක් සහිත ජ්‍යෙෂ්ඨ ගුරුවරියක වන බවත් වර්තමානයේ ගා/පී. ද එස්. කුලරත්න විද්‍යාලයේ 6 සහ 7 ශ්‍රේණිවල අංශ ප්‍රධානී ලෙසත්, ශිෂ්‍ය උපදේශන හා ප්‍රථමාධාර කටයුතු භාරව රාජකාරි කරන බවත් සඳහන් කර ඇත. 2026.03.12 වන දින හයවන කාලච්ඡේදයේදී තමා ගෘහ විද්‍යාගාරයේ රාජකාරි

කරමින් සිටියදී, ප්‍රථමාධාර ලබාගැනීම සඳහා සිසුන් කිහිප දෙනෙකු පැමිණි බවත්, එහිදී වින්දිත දිල්නුක සිසුවා ද පන්ති කාමරයේ අනෙකුත් සිසුන් සමඟ එහි පැමිණ සිටි බවත්ය. වින්දිත දිල්නුක ශිෂ්‍යයාගේ අත් දෙකෙහි වූ රතු පැහැති ඉරි දෙකක සලකුණු දුටු අවස්ථාවේදී ඒ පිළිබඳව හේතු විමසූ බවත්, එහිදී *'විද්‍යා සර් වැඩ කරන් ආවේ නැති හැමෝටම ගැහුවා'* යනුවෙන් සිසුවෙකු තමා වෙත ප්‍රකාශ කළ බවත් සිය ලිපිය මඟින් වැඩිදුරටත් සඳහන් කර ඇත.

නමුත් විමර්ශන අවස්ථාවේ දී කරුණු දක්වමින්, සිසුවාගේ ශරීර ස්වභාවය හා පැහැය අනුව සුළු බලපෑමකදී පවා සම රතු පැහැ ගැන්වෙන බවත්, ලේ ගලන මට්ටමේ තුවාල නොතිබූ බැවින් ඉදිමුණු ස්ථාන සඳහා අයිස් කැට තැබීමට වෙනත් සිසුවෙකු මඟින් ප්‍රථමාධාර ලබා දී ඇති බවට ප්‍රථමාධාර ලබාදීම් ලේඛණයේ පිටපත් ඉදිරිපත් කර ඇත. මෙම සිදුවීම පිළිබඳව දරුවාගේ මවට දැනුම් දීමට අවශ්‍ය දැයි ඇය විමසූ අවස්ථාවේදී සිසුවා එය ප්‍රතික්ෂේප කළ බවත්, පාසල අවසන් වන අවස්ථාවේදී ද සිසුවා සාමාන්‍ය පරිදි පාසලෙන් පිටව ගිය බව ඇය වැඩිදුරටත් සඳහන් කර ඇත.

එසේම, සිද්ධියෙන් පසු දින, එනම් 2026.03.13 වන දින තමා සුමිත් ගුරුවරයා සමඟ විදුහල්පතිවරයා හමුවූ අවස්ථාවේදී, පවරන ලද වැඩ කටයුතු සම්පූර්ණ නොකළ සිසුන්ට දඬුවම් කළ බවත් ඒ අනුව වින්දිත සිසුවාට ද පහර දුන් බව සුමිත් සර් පිළිගත් බව පන්ති භාර ගුරුවරිය සිය ලිපිය මඟින් සඳහන් කර ඇත. තවද, ඉගැන්වීම් කටයුතු නිසි පරිදි දරුවන්ට ලබා දීමේ අරමුණින් තමා එසේ කළ බවත්, ඉදිරියේදී කිසිදු දරුවෙකුට මෙවැනි දඬුවම් නොකරන බවත් සුමිත් සර් එහිදී ප්‍රකාශ කළ බව ද ඇය වැඩිදුරටත් සඳහන් කර ඇත. එදිනම දරුවාගේ පියා සමඟ දුරකථනයෙන් සම්බන්ධ වී දරුවාගේ සුවදුක් විමසූ විට, දරුවාගේ අතේ ගැම සඳහා ආලේපනයක් ලබා දී ඔහුව නිවසට රැගෙන ආ බව පියා තමාට දැනුම් දුන් බවත් සඳහන් කර ඇත.

විමර්ශන අවස්ථාවේ දී, වසර 36ක සේවා කාලයක් සහිත ගුරුවරියක සහ පාසලේ ශිෂ්‍ය උපදේශන කටයුතු භාර නිලධාරිනියක ලෙස කරුණු දක්වමින්, මෙවැනි සිදුවීම් තවදුරටත් දුරදිග ගෙන යාම වින්දිත දරුවාගේ මෙන්ම පන්තියේ සෙසු සිසුන්ගේ ද මානසිකත්වයට හානිකර ලෙස බලපෑ හැකි බවත්, දරුවාගේ අධ්‍යාපනික හා මානසික යහපත සලකා මෙවැනි අමිහිරි සිදුවීම් සමථයකින් විසඳාගත යුතු බවත්, ඒවා තවදුරටත් විමර්ශනය කිරීම තුළින් දරුවාගේ අනාගතයට පීඩාවක් එල්ල විය හැකි බවත් වැඩිදුරටත් ප්‍රකාශ කර ඇත.

**03. තෙවන වගඋත්තරකරු : විදුහල්පති (ගා/පී. ද එස්. කුලරත්න විද්‍යාලය)**

2026.04.28 වන දින මානව හිමිකම් කොමිෂන් සභාවේ පවත්වන ලද විමර්ශනයේදී සහ 2026.04.24 දිනැති වාර්තාව මගින් කරුණු දක්වමින්, අදාළ සිද්ධිය සම්බන්ධයෙන් ඔහු මුලින්ම දැනුවත් වූයේ 2026.03.12 දින පස්වරුවේ සිසුවාගේ පියා විසින් ලබාදුන් දුරකථන ඇමතුමකින් බවයි. එම අවස්ථාව වන විටත් සිද්ධිය පිළිබඳව ඔහු දැනුවත් වී නොසිටි බැවින්, වහාම පන්ති භාර ගුරුතුමිය වන සුදර්ශනී මහත්මියට දුරකථන ඇමතුමක් ලබා දී කරුණු විමසූ බවයි. එහිදී පන්ති භාර ගුරුවරිය විසින් දරුවාගේ දෑත්හි වේවැල් පහර සලකුණු දුටු බවත්, ඒ සඳහා අයිස් තබා ගැනීමට උපදෙස් දී දරුවාගෙන් විමසූ විට නිවසට දැනුම් දීම අවශ්‍ය නොවන බව දරුවා ප්‍රකාශ කළ බවත් තමාට දැනුම් දුන් බව විදුහල්පතිවරයා වැඩිදුරටත් සඳහන් කර ඇත. මෙම තොරතුරු තහවුරු කරගැනීමෙන් පසු සිසුවාගේ මව සමඟ ද දුරකථනයෙන් සම්බන්ධ වී දරුවාගේ තත්ත්වය පිළිබඳව සොයා බැලූ බවයි.

සිද්ධිය සම්බන්ධයෙන් 2026.03.13 වන දින අදාළ විෂය භාර ගුරුවරයා සහ පන්ති භාර ගුරුවරිය විදුහල්පති කාර්යාලයට කැඳවා කරුණු විමසූ බවත්, එහිදී සුමිත් හෙන්දහේවා මහතා විසින් 7-ඩී ශ්‍රේණියේ විද්‍යා විෂය කාලච්ඡේදය අතරතුර පොත් රැගෙන නොපැමිණි සිසුන් කිහිප දෙනෙකුට ඔහු විසින් පහරදුන් බවත්, ඒ අතර වින්දිත දිල්නුක සිසුවාට ද පහර දුන් බව පිළිගත් බවයි. කෙසේ වුවද, මෙම ක්‍රියාව දරුවන් ඉගෙනීමට යොමු කිරීමේ යහපත් චේතනාවෙන් සිදු කරන ලද්දක් බව ඔහු සඳහන් කළ නමුත්, එවැනි දඬුවම් පැමිණවීම සම්පූර්ණයෙන්ම වැරදි සහගත බව පෙන්වා දෙමින් තමා එම ගුරුවරයාට දැඩි ලෙස අවවාද කළ බවත්, එම සිසුවා ඉගෙනුම ලබන පන්තියේ විද්‍යා විෂය ඉගැන්වීමේ කටයුතුවලින් වහාම ක්‍රියාත්මක වන පරිදි ඔහුව ඉවත් කිරීමට පියවර ගත් බවත්ය. මෙම

සියලු කරුණු සහ ගනු ලැබූ පියවර විද්‍යාලයේ අංක 09 දරන ලොග් සටහන් පොතෙහි විධිමත්ව වාර්තා කර ඇති බවට අදාළ පිටපත් ඉදිරිපත් කර ඇත.

එසේම, 2026.03.16 වන දින සිසුවා සහ ඔහුගේ පියා පාසලට කැඳවා තමා විසින් දරුවාව පරීක්ෂා කළ බවයි. එහිදී දරුවාගේ දෑත්හි ඉහළ කොටස් වල මැකී යමින් පැවති වේවැල් පහරක, දෙකක සලකුණු දක්නට ලැබුණු බවත්, ගනු ලැබූ පරිපාලනමය ක්‍රියාමාර්ග පිළිබඳව පියා දැනුවත් කර දරුවා අඛණ්ඩව පාසල් එවන ලෙස ඉල්ලා සිටි බවයි. අනතුරුව, 2026.03.18 වන දින අම්බලන්ගොඩ කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරිය වෙත ලිඛිතව වාර්තා කරමින් අදාළ ගුරුවරයා සම්බන්ධයෙන් පියවර ගන්නා ලෙසත් ඔහුව ස්ථාන මාරු කරන ලෙසත් ඉල්ලීමක් කළ බවයි. ඒ අනුව කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරියගේ නියෝග මත 2026.04.06 දින සිට ක්‍රියාත්මක වන පරිදි අදාළ ගුරුවරයා වෙනත් පාසලකට ස්ථාන මාරු කර සේවයෙන් නිදහස් කිරීමට කටයුතු කර ඇති බව සඳහන් කර ඇත.

විමර්ශන අවස්ථාවේ දී කරුණු දක්වමින්, දශක හතරක පමණ ඉතිහාසයක් ඇති සිය විද්‍යාලයේ කීර්තිනාමයට සහ සිසුන්ගේ මෙන්ම ගුරුවරුන්ගේ මානසිකත්වයට මෙම සිදුවීම අහිතකර ලෙස බලපා ඇති බවත්, මේ වන විට අම්බලන්ගොඩ පොලිස් ස්ථානය සහ දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව මගින් මේ සම්බන්ධයෙන් විමර්ශන පවත්වමින් පවතින බවත්, පාසල් ප්‍රජාවට සහ පාසලේ ගෞරවයට සිදුවන හානිය සැලකිල්ලට ගෙන, මෙම ගැටලුව සුහදව නිරාකරණය කරගැනීමට පැමිණිලිකාර පාර්ශවයේ කැමැත්තක් පවතින්නේ නම් ඒ පිළිබඳව අවධානය යොමු කරන ලෙස විදුහල්පතිවරයා යෝජනා කර ඇත.

**04. සිව්වන වගඋත්තරකරු: කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ (අම්බලන්ගොඩ කලාප අධ්‍යාපන කාර්යාලය)**

මෙම සිද්ධිය සම්බන්ධයෙන් අම්බලන්ගොඩ කලාප අධ්‍යාපන කාර්යාලය විසින් ඉදිරිපත් කරන ලද වාර්තාවට අනුව, පැමිණිල්ලට පාදක වූ ගුරු චර්යාව සහ සිසුවාට සිදු වූ ශාරීරික පීඩාව පිළිබඳව විදුහල්පතිවරයා විසින් කරන ලද දැනුම්දීම කෙරෙහි කලාප අධ්‍යාපන බලධාරීන්ගේ අවධානය යොමු ව ඇත. ඒ අනුව, සිද්ධියේ කරුණු සහ විමර්ශන කටයුතු ස්වාධීනව පවත්වාගෙන යාමේ අවශ්‍යතාව සලකා කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරිය, සුමිත් හෙන්දහේවා ගුරුවරයා වහාම ක්‍රියාත්මක වන පරිදි 2026.03.31 දින සිට ගා/රන්දොඹ දම්නද විද්‍යාලය වෙත ස්ථාන මාරු කිරීමට පියවර ගෙන ඇති බව දැනුම් දී ඇත.

තවද, විමර්ශන අවස්ථාන සඳහා සහභාගී වූ කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරිවය, මෙම සිදුවීම අධ්‍යාපන අමාත්‍යාංශය විසින් නිකුත් කර ඇති ශිෂ්‍ය විනය සුරැකීම හා ශාරීරික දඬුවම් තහනම් කිරීම පිළිබඳ චක්‍රලේඛ උල්ලංඝනය කිරීමක් ද යන්න පිළිබඳව සොයා බැලීම සඳහා දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව මගින් මූලික විමර්ශනයක් දැනටමත් ආරම්භ කර ඇති බව සඳහන් කර ඇත. එම විමර්ශන වාර්තාවේ නිර්දේශ මත පදනම්ව අදාළ ගුරුවරයා සම්බන්දයෙන් ගත යුතු ඉදිරි ක්‍රියාමාර්ග සම්බන්ධයෙන් කලාප අධ්‍යාපන කාර්යාලය සහ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව එක්ව කටයුතු කරන බවත්, දරුවාගේ අධ්‍යාපන අයිතිවාසිකම් සහ ආරක්ෂාව තහවුරු කිරීම සඳහා අවශ්‍ය සියලු මැදිහත්වීම් සිදු කර ඇති බවත් වැඩිදුරටත් සඳහන් කර ඇත.

**05. පස්වන වගඋත්තරකරු: ළමා හා කාන්තා කාර්යාංශයේ ස්ථානාධිපති, පොලිස් ස්ථානය - අම්බලන්ගොඩ**

2024.04.28 දින මානව හිමිකම් කොමිෂන් සභාවේ පැවති විමර්ශනයේ දී කා.උ.පො.ප රේණුකා මිය සහ 2026.04.25 වන දිනැති සවිස්තරාත්මක වාර්තාව මඟින් අම්බලන්ගොඩ මූලස්ථාන පොලීසිය, ළමා හා කාන්තා කාර්යාංශය විසින් පහත කරුණු ඉදිරිපත් කර ඇත.

මෙම සිද්ධිය සම්බන්ධයෙන් වින්දිත දරුවාගේ මව විසින් 2026.03.12 දින පැය 16:30ට අම්බලන්ගොඩ පොලිස් ස්ථානයේ ළමා හා කාන්තා කාර්යාංශය වෙත කරන ලද පැමිණිල්ලකට අනුව

විමර්ශන ආරම්භ කර ඇත. පහරදීම හේතුවෙන් තුවාල ලැබූ සිසුවා බලපිටිය මූලික රෝහලේ 01 වන වාට්ටුවේ ප්‍රතිකාර ලබමින් සිටියදී 2026.03.12 වන දින පැය 5.00ට පොලිස් නිලධාරීන් විසින් වින්දිත සිසුවාගේ දෑත්වල බාහුවෙහි කොටුවක් වැනි දෙයකින් පහරදුන් බවට තැලීම් පහරවල් දක්නට ලැබෙන බවත් සටහන් කර ඇති අතර, එහි සිසුවාගේ ප්‍රකාශය පහත පරිදි සටහන් කරගෙන ඇත.

*"2026.03.12 දින උදේ 07.15ට පමණ ඉස්කෝලෙට ගියා. පාසලේ ඉගෙනීම් කටයුතු ද අපි කරගෙන ගියා. අපිට 05 වන පීරියඩ් එකේ තිබූ විද්‍යා විෂය පන්තියේ විද්‍යා පිරියඩ් එක පටන් ගත්තේ 11.00 ට විතර අද තිබුණු විද්‍යා පන්තිය තිබුණේ විද්‍යාගාරයේ. ළමයි පන්තියේ අය සේරම අය විද්‍යාගාරයට ගියා. ඒ වෙනකොට මම තුවාල වුණ ළමයෙක් අරගෙන ප්‍රතිකාර ලබාදෙන්න ගෘහ විද්‍යාගාරයට ගියා. ළමයගේ නම සසන්. ගෘහ විද්‍යාගාරයේ ප්‍රතිකාර කරන බඩු තියෙන්නේ. සසන් සමග ප්‍රතිකාර ලබාගෙන පන්තියට ගියා පොත් ටික අරගෙන විද්‍යාගාරයට යන්න. ඒ යන අතරේ පඩි පෙළ බහින කොට විද්‍යාව උගන්වන සුමිත් සර් හම්බ වුණා. සර් ඇහුවා කොහෙද යන්නෙ කියලා. අපි කිව්වා පොත් අරන් එන්න පන්තියට යනවා කියලා. සර් එතකොට කිව්වා අද ලියන්න දේවල් නැහැ විද්‍යාගාරයට යන්න කියලා. අපි ඒ පාර විද්‍යාගාරයට ගියා.*

*සර් අපේ පන්තියේ විද්‍යාගාරයට ආවා. ළමයි ඉදගත්තා. සර් පන්තියේ ඉදගෙන ළමයි සේරමගෙන් ඇහුවා මම ඊයෙ රූප සටහනක් අඳින්න දුන්නා. ඇන්දද කියලා. ඒ වෙලාවෙ සර් වේවැල අතට ගත්තා. මගෙන් තමයි මුලින්ම රූප සටහන බලන්න ආවේ. මගෙන් ඇහුවා කෝ කියලා. මම පොත් ගෙනාවෙ නැහැ මට පෙන්නන්න දෙයක් නැහැනේ. මම පොත ගෙනාවේ නැහැ කියන්න හදන කොටම අතේ තිබුණ වේවැලෙන් ගහගෙන ගහගෙන ගියා මට කිසි දෙයක් කියන්න වෙලාවක් වුණේම නැහැ. පන්තියේ ගොඩක් ළමයින්ට ගැහුවා. ගැහැණු ළමයින්ටත් ගැහුවා. සදිල්ට ගහපු පාරට අතේ පොතු ගිහිල්ලා කියලා යාළුවෙක් මට කීවා. ඒ වෙලාවේ මම පොත ගේන්න පන්තියට ගිහිල්ලා හිටියෙ. දවසක් මගේ පන්තියෙ ඉන්න මියුරංගගෙ ඔළුවෙන් උස්සලා බිමින් තීවා. විද්‍යාව උගන්වන සුමිත් සර් ගොඩක් සැරයි. අපිට නිදහසේ ඉගෙන ගන්න අපිට අමාරුයි. අපිට නිදහසේ ඉගෙන ගන්න කටයුතු සලසා දෙන ලෙසයි විද්‍යා සර් කියල දෙන ඒවා තේරෙන්නෙ නැහැ කේන්තියෙන් වගේ ඉන්නේ"*

මෙම පැමිණිල්ලට අදාළව බලපිටිය මහේස්ත්‍රාත් අධිකරණය වෙත 2026.03.16 දින නඩු අංක 91644 යටතේ කරුණු වාර්තා කිරීමට පොලිසිය පියවර ගෙන ඇත. විමර්ශනවල ප්‍රගතිය සලකා බලමින් 2026.04.02 දින අධිකරණයට ඉදිරිපත් කළ වැඩිදුර වාර්තාවකට අනුව, සැකකාර සුමිත් ප්‍රියන්ත හෙන්දහේවා යන අයට 2026.07.24 වන දින අධිකරණයේ පෙනී සිටින ලෙස දන්වා නොතීසි නිකුත් කර තිබේ. පාසල් කාලය තුළ ගුරුවරයෙකු විසින් ශිෂ්‍යයෙකුට සිදු කරන කායික හිංසනයන් සම්බන්ධයෙන් ක්‍රියා කළ යුතු ආකාරය පිළිබඳව 2019.08.07 දින නීතිපතිතුමා විසින් නිකුත් කර ඇති උපදෙස් මාලාවට අනුව, සැකකරු අත්අඩංගුවට ගැනීමක් සිදු නොකළ බවත්, ඔහුගෙන් පහත පරිදි ප්‍රකාශයක් පමණක් ලබා ගැනීමට කටයුතු කර ඇති බව සඳහන් කර ඇත.

*"2026.03.12 වන දින මා පාසලේ ඉගැන්වීම් කටයුතු වල නිරත වුණා. මගේ මතකයේ හැටියට 07 - D ශ්‍රේණියට විද්‍යාව උගන්වන ළමයි සමග විද්‍යාගාරයට යමින් සිටියා. ඒ යන ගමන් තවත් ළමයි තුන්දෙනෙක් හමු වුණා. ඒ ළමයි මේ පන්තියේ නිසා ලෙඩ ළමයා හැර අනිත් ළමයි දෙන්නාට පොත් අරගෙන එන්න කීවා මම ලැබ් එක ලගට ගිහිල්ලා ළමයි ඇතුලට අරගෙන දරුවො මට ආයුබෝවන් සර් කියලා කීවම මම කීවේ ඊයෙ කරපු වැඩ බලන්න පොත් ගන්න කියලා.*

*මේසෙ උඩ තිබුණ කෝටුවක් අරගෙන ගෙදර වැඩ නොකරපු ළමයි කවුද කියලා ඇහුවා. ඊට පස්සෙ එක ළමයෙක් කලබල වෙලා එහාට මෙහාට පැන්නා. එතකොට කෝටුව මම වැනුවා කෝටුව ඒ දරුවගෙ අතේ වදින්න ඇති. නමුත් ඒ ළමයා පොත ගෙනැල්ලා නැහැ කීවම ආපහු පංතියට දුවල ගිහිල්ලා පොත ගෙනාවා. ගෙනැල්ලා ප්‍රැක්ටිකල් කලා. ඒ වෙලාවේ කිසිම ප්‍රශ්නයක් ඇති වුණේ නැහැ වෙලාව 1130 ට ඇති ලැබ් එක ඇතුලේ තමයි සිද්ධ වුණේ. පසුව මට ආරංචි වුණා පාසල ඇරුනට පස්සෙ විදුහල්පතිතුමා කථා කරලා කීවා සුමිත් ඔයා ළමයෙකුට ගැහුවද මම හිතුවේ නැහැ*

*ඔයා ළමයින්ට ගහන කෙනෙක් කියලා විදුහල්පතිතුමාද මට කීවා. ඒ වෙලාවෙ මම ආපස්සට කල්පනා කලා මම ළමයෙකුට ගැහුවද කියලා මම ගැහුවත් ළමයින්ට වෛර චේතනාවකින් පහරදීලා නැහැ. මම ඒ නිසා කලබල වුණේ නැහැ. කෝටුව වනනකොට වැදුණද දන්නේ නැහැ.*"

විමර්ශන කටයුතු වල දී පන්ති භාර ගුරුවරිය (සුදර්ශනී මිය), විද්‍යාගාර සහයිකාව (නයෝමි මිය), සහ තොරතුරු තාක්ෂණ විෂය භාර ගුරුවරයාගෙන් ද ප්‍රකාශ ලබාගෙන ඇත. විද්‍යාගාරය තුළ සී.සී.ටී.වී (CCTV) කැමරා පද්ධතියක් ක්‍රියාත්මක නොවන බවත්, පහරදීමට යොදාගත් බව කියන වේවැල පන්ති කාමරය පිරිසිදු කිරීමේදී ඉවත් කර ඇති බවත් පන්ති භාර ගුරුවරිය සඳහන් කර ඇති බව සටහන් අනුව නිරීක්ෂණය වේ. තවද, පහරදීමට ලක්වූ බව කියන අනෙකුත් සිසුන්ගෙන් ද ප්‍රකාශ සටහන් කරගෙන ඇති අතර, ඔවුන් බොහෝ දෙනෙකු ඔවුන්ට ද පහරදීම් සිදු වූ බව සඳහන් කර ඇත.

කෙසේ වුවද, විමර්ශනවලදී පෙනී ගොස් ඇත්තේ වින්දිත සිසුවාගේ පාර්ශවය නීතිමය ක්‍රියාමාර්ග අපේක්ෂා කළද, සිද්ධියට මුහුණ දුන් අනෙකුත් ඇතැම් සිසුන්ගේ දෙමාපියන් සිය ප්‍රකාශ මගින් ගුරුවරයාට එරෙහිව නීතිමය ක්‍රියාමාර්ග ගැනීම ප්‍රතික්ෂේප කර ඇති බවයි. ඔවුන් දරුවන් හික්මවීම සඳහා ගුරුවරුන් විසින් සිදු කරන දඬුවම් කෙරෙහි තමන් විරුද්ධ නොවන බවත්, එමනිසා ගුරුවරයාට එරෙහිව සාක්ෂි දීමට අකමැති බවත් එම දෙමාපියන් ප්‍රකාශ කර ඇත. මෙම තත්ත්වය සැලකිල්ලට ගෙන, ඉදිරි නෛතික කටයුතු සඳහා නීතිපතිතුමාගේ උපදෙස් ලබා ගැනීමට අවශ්‍ය විමර්ශන ගොනු සකස් කර යැවීමට පොලිසිය දැනටමත් පියවර ගෙන ඇති බව වැඩිදුරටත් සඳහන් කර ඇත.

<u>අධිකරණ වෛද්‍ය වාර්තාව (JMO Report)</u>

පැමිණිල්ලට අදාළව බලපිටිය මූලික රෝහලේ වාට්ටු අංක 01 හි ප්‍රතිකාර ලැබූ වින්දිත ශිෂ්‍යයා, 2026.03.13 වන දින අධිකරණ වෛද්‍ය නිලධාරියා විසින් පරීක්ෂාවකට ලක් කර ඇත. 2026.03.12 දින රෝහල් ගත කරන ලද මෙම ශිෂ්‍යයා, පරීක්ෂණ කටයුතුවලින් අනතුරුව 2026.03.13 වන දින රෝහලෙන් මුදා හැර තිබේ.

වෛද්‍ය පරීක්ෂණයේදී රෝගියා විසින් ලබා දී ඇති කෙටි ඉතිහාසය (Short History) අනුව, "*2026.03.12 උදේ 11.30ට විතර, ඉන්ටවල් එකෙන් පස්සේ පස්වන පිරියඩ් එකේ විද්‍යාව (සුමිත්සර්) මට වේවැලෙන් අත් දෙකට ගහගෙන ගියා. කුලරත්න ඉස්කොලෙට මන් යන්නේ*" ලෙස සටහන් කර ඇත.

එහි ශිෂ්‍යයාගේ ශරීරය මත පහත සඳහන් තුවාල සහිත බව ද සහන් කර ඇත.

1. An obliquely placed linear contusion 12cm x0.5cm in size in the back of the left elbow region. It's colour was reddish blue (වම් වැලමිට ප්‍රදේශයේ පිටුපස 12cm x0.5cm ප්‍රමාණයේ ආනතව තබා ඇති රේඛීය තැලීමක්. එහි වර්ණය රතු පැහැයට හුරු නිල් පැහැයක් ගනී)
2. An obliquely placed linear contusion 10cm x 0.5cm in size in the back of the left elbow region. It's colour was reddish blue (වම් වැලමිට ප්‍රදේශයේ පිටුපස 10cm x 0.5cm ප්‍රමාණයේ ආනතව තබා ඇති රේඛීය තැලීමක්. එහි වර්ණය රතු පැහැයට හුරු නිල් පැහැයක් ගනී.).
3. A linear contusion 5cm x 0.5cm in size in the middle third of the posterior aspect of left the arm. It's colour was reddish blue (වම් බාහුවේ පිටුපස මැද කොටසේ පිහිටි සෙ.මී. 5 x 0.5 ප්‍රමාණයේ රේඛීය තැලීමක්. එහි වර්ණය රතු පැහැයට හුරු නිල් පැහැයක් ගනී )
4. Irregular contusion roughly circular in shape,2cm x 2cm in size in the middle third of the posterior aspect of the left forearm. It's colour was blue (වම් ආතේ යටිබාහුවේ මැද කොටසේ පිහිටි සෙ.මී. 2 x 2 ප්‍රමාණයේ දළ වශයෙන් වටකුරු හැඩයකින් යුත් තැලීමක් වේ. එය නිල් පැහැතිය.)

5. A linear contusion 5cm x 0.5cm in size in the upper third of the anterior aspect of the right arm. It's colour was reddish blue (දකුණු බාහුවේ ඉදිරිපස ඉහළ කොටසේ පිහිටි සෙ.මී. 5 x 0.5 ප්‍රමාණයේ රේඛීය තැලීමක් වේ. එය රතු පැහැයට හුරු නිල් පැහැතිය).

අධිකරණ වෛද්‍ය මතය අනුව, මෙම සියලු තුවාල බරපතල ගණයේ නොවන (Non-grievous) මට්ටමේ පවතින අතර, ඒවා මොට ආයුධයක් (Blunt weapon) භාවිතා කර සිදු කරන ලද බලපෑමක් හේතුවෙන් ඇති වූ තුවාල රටාවක් බව තහවුරු කර ඇත. ඒ අනුව, වින්දිත පාර්ශවය විසින් ලබා දෙන ලද පහරදීම පිළිබඳ ඉතිහාසය ප්‍රතික්ෂේප කළ නොහැකි බවත් (Given history cannot be excluded), එය වෛද්‍ය විද්‍යාත්මක නිරීක්ෂණ සමඟ අනුකූල වන බවත් අධිකරණ වෛද්‍යවරයා සිය වාර්තාවේ සඳහන් කර තිබේ.

<u>නිරීක්ෂණ</u>

01. ගා/පී.ද එස්. කුලරත්න විද්‍යාලයේ 7-ඩී ශ්‍රේණියේ ඉගෙනුම ලබන 11 හැවිරිදි දිල්නුක ශිෂ්‍යයාට, 2026.03.12 වන දින විද්‍යා විෂය භාර සුමිත් නමැති ගුරුවරයා විසින් විද්‍යාගාරය තුළදී වේවැලකින් පහරදී ඇති බවත්, ඒ හේතුවෙන් දරුවා බලපිටිය මූලික රෝහලේ නේවාසිකව ප්‍රතිකාර ලබා ඇති බවත් පැමිණිලිකාර පියා සඳහන් කර ඇත. පොත් රැගෙන නොපැමිණීම යන හේතුව මත මෙම පහරදීම සිදු කර ඇති අතර, සිද්ධිය පිළිබඳව පන්ති භාර ගුරුවරිය සහ විදුහල්පතිවරයා මුල් අවස්ථාවේදී නිසි මැදිහත්වීමක් සිදු නොකර සිය වගකීම් පැහැර හැර ඇති බවට ද පැමිණිල්ල මගින් චෝදනා එල්ල කර ඇත.

02. පහරදීමේ සිද්ධිය සම්බන්ධයෙන් පළමු වගඋත්තර සුමිත් ප්‍රියන්ත ගුරුවරයා විසින් පොලිසිය සහ කොමිෂන් සභාව වෙත ලබාදී ඇති ප්‍රකාශයන් පිරික්සීමේදී, සිද්ධියේ වගකීමෙන් මිදීම සඳහා ඔහු සිය ප්‍රකාශයන් අවස්ථානුකූලව වෙනස් කරමින් ස්වයං සාධාරණීකරණයක නිරත වී ඇති බව නිරීක්ෂණය වේ. ආරම්භයේදී විදුහල්පතිවරයා හමුවේ තමා සිසුන්ට දඬුවම් කළ බවත්, එම පහරදීම සිසුන් ඉගෙනීමට යොමු කිරීමේ "යහපත් චේතනාවෙන්" සිදු කළ බවත් ඔහු පිළිගෙන ඇති නමුත්, පසුව පොලිසිය සහ කොමිෂන් සභාව හමුවේ එම ප්‍රකාශය වෙනස් කරමින් මෙය වේවැල් කැබැල්ලක් වැනීමේදී "නොදැනුවත්ව" හෝ "අචේතනිකව" දරුවාගේ ශරීරයේ වැදුණු අහඹු සිදුවීමක් ලෙස අර්ථකථනය කිරීමට ඔහු උත්සාහ කර ඇත.

තවද, සිය වසර 32ක දීර්ඝ සේවා කාලය, ජාතික මට්ටමේ ඇගයීමට ලක්වූ ගුරුවරයෙකු වීම සහ සිය පෞද්ගලික ජීවිතයේ දරුවන් ලබා ඇති සාර්ථකත්වය වැනි කරුණු සිය දිවුරුම් ප්‍රකාශ මගින් දීර්ඝ ලෙස ඉදිරිපත් කරමින්, සිය පෞරුෂය සහ වෘත්තීය ඉතිහාසය මෙම වරදින් මිදීම සඳහා යොදා ගැනීමට ඔහු උත්සාහ කර තිබේ. කෙසේ වුවද, මුල් අවස්ථාවේදී විදුහල්පතිවරයා ඉදිරියේ වරද පිළිගැනීමත්, පසුව එය "අහඹු සිදුවීමක්" ලෙස අර්ථකථනය කිරීමත් තුළ පවතින පරස්පරතාව සහ එම ප්‍රකාශය අධිකරණ වෛද්‍ය වාර්තාවේ සඳහන් වන බහුවිධ තුවාල රටාව සමඟ තාර්කිකව නොගැළපීම මගින් වගඋත්තරකරුගේ ප්‍රකාශයේ විශ්වාසනීයත්වයේ ගැටලුවක් පවතින බව නිරීක්ෂණය වේ.

03. අම්බලන්ගොඩ පොලිස් ස්ථානය විසින් වින්දිත සිසුවා ඉගෙනුම ලබන පන්තියේ සිසුන් කිහිප දෙනෙකුගෙන් ලබාගෙන ඇති ප්‍රකාශයන් පිරික්සීමේදී, අදාළ පහරදීමේ සිදුවීම සහ සුමිත් ගුරුවරයාගේ හැසිරීම් රටාව පිළිබඳව සිසුන් ප්‍රකාශ කර ඇති බව නිරීක්ෂණය වේ.

*"....2026.03.12 වන දින ඉන්ටවල් එකේ පිට්ටනියෙදි තුවාල වුණා. ඒකට බෙහෙත් දාන්න දිල්නුක සමග ගියා. ඒ ගිහිල්ලා එනකොට පඩිපෙල ලගදි විද්‍යාව භාර ගුරුතුමා සුමිත් සර් හමබවුණා. ඔයාලා කොහෙද යන්නේ ඇහුවා. අපි කීවා පන්තියට යනවා පොත් අරගෙන එන්න කියලා. ඊට පස්සෙ සුමිත් සර් කීවා අද මොකුත් උගන්වන්නේ නැහැ ලැබ් එකට යන්න කියලා. ඒ නිසා මාත් දිල්නුක සමග ආවා. අපි සර් පන්තියට ආවම ආයුබෝවන් කියලා පිළිගත්තා. එය පස්වන පීරියඩ් එක. ඊට පස්සෙ සර් දිල්නුකගෙන පොත කෝ කියලා ඇහුවා. දිල්නුකත් මාත් කීවා ඇයි සර් කීවේ පඩිපෙල ලගදි පොත් ගේන්න ඕන නැහැ කියලා. ඊට පස්සෙ සර් දිල්නුකට*

*මේසෙ උඩ තිබුණු වේවැලක් වගේ කෝටුවකින් අත්දෙකට ගහගෙන ගහගෙන ගියා. ඊට පස්සෙ සර් දිල්නුකට පල ගිහින් පොත් ටික අරන් වරෙන් කීවා. දිල්නුක අතේ පෑනත් ගුලි කරගෙන ගියා. පසුව දිල්නුක පන්තියට ගිහින් පොත් අරගෙන ආවා. පීරියඩ් එක ඉවර වුණාට පස්සෙ හෝම් සයන්ස් කාමරයට ගිහිල්ලා සුදර්ශනී මිස්ට කීවා. දිල්නුකගේ අතට හෝම් සයන්ස් මිස් සුදර්ශනී අයිස් තිබ්බා. ඊට පස්සෙ ගෙදර යනකොට අත් දෙකේ වැලිමිටට උඩින් පාරවල් තිබුණා. දිල්නුක ඇඬුවත්...." (පළමු ශිෂ්‍යාගේ ප්‍රකාශය)*

*"....2026.03. 12 දින අපි විද්‍යාගාරයට ආවා ඒ ආපු වෙලාවේ සුමිත් සර් ඇහුවා පොත් ගෙනාවේ නැති අයයි ඊයෙ දීපු වැඩ කරපු නැති අයයි ගැන අහල පොත් ගෙනාවේ නැති අයට වේවැලෙන් ගැහුවා. දිල්නුකටත් ගැහුවා. මටත් වේවැලෙන් පාරක් ගැහුවා. මට ගැහුවේ එක පාරයි. මට රිදුනා මට කීවා ගැහැණු ළමයින්ට හයියෙන් ගහන්නේ නැහැ කීවා. දිනිති, දිනුනි යන අයටත් පොත් ගෙනාවේ නැති නිසයි ඊයේ දුන්න වැඩ කරගෙන ආවේ නැහැ කියලා තමයි ගැහුවේ...." (දෙවන ශිෂ්‍යාගේ ප්‍රකාශය)*

*"....2026.03 12 විද්‍යා පිරියඩ් එකේ ප්‍රැක්ටිකල් වලට ලැබ් එකට ආවා පස්වන පිරියඩ් එකේ. ඒ ආවම විද්‍යාව උගන්වන සුමිත් සර් ආවා. අපි නැගිටල සර්ට ආයුබෝවන් කීවා. ඊට පස්සෙ පොත් ගෙනාපු නැති අයයි වැඩ කරේ නැති අයයි කවුද කියලා ඇහුවා. ඒ අහල වැඩ කරල නැහැ කියල මගේ දකුණු අතට වේවැලෙන් පාරක් ගැහුවා. ඒ පාර ඩෙස් එකට වැදිල මගේ ඇගිල්ලටත් වැදුණා රිදෙන නිසා මම ඇඬුවා...." (තෙවන ශිෂ්‍යාගේ ප්‍රකාශය)*

*"...2026.03.12 දින පස්වන පීරියඩ් එකේදි පොත් ගෙනාවේ නැහැ කියලා සර් දකුණු අතට වේවැලෙන් පාරක් ගැහුවා.මට රිදුනා..." (සිව්වන ශිෂ්‍යාගේ ප්‍රකාශය)*

*".....2026.03.12 වන දින නෙවේ මට විද්‍යාව සර් ගැහුවේ. දවසක් මගේ කන් දෙකෙන් උස්සල බිමට අතඇරියා. ඊට පස්සේ මම ඇඬුවා. 2026.03.12 වන දිනත් පොත ගෙනාවේ නැහැ කියලා මට ගැහුවා. මාත්ඇඬුවා. හැබැයි සර් වැඩ නොකොලොත් ළමයි කෑගැහුවොත් තමයි කේන්ති ගිහිල්ලා ගහන්නෙ. නැත්නම් මට ගහන්නෙ නැහැ....." (පස්වන ශිෂ්‍යාගේ ප්‍රකාශය)*

*".....2026.03.12 වෙනිදා වගේ තමා මතක. ඒක වුණේ එදින විද්‍යාව පිරියඩ් එක දවසේ මට හරියටම වේලාව මතක නැහැ මට ගැහුවේ අපිට විද්‍යාව උගන්වන සුමිත් සර් තමයි. මට ගැහුවේ මම ඊට කලින් දවසේ ඉස්කෝලෙ ආවේ නැහැ මම ආපු නැති දවසේ කරන් එන්න දීපු ගෙදර වැඩ කරගෙන ආවේ නැහැ කියලා තමයි මට ගැහුවේ. මට වේවැලෙන් තමා ගැහුවේ. මට මගේ වම් අතේ අල්ලට පහළ අතේ යටි පැත්තට තමා ගැහුවේ. මට ගැහුවේ එක පාරයි. මට ඒ පහර වැදුණ තැන රතු පාට වෙලා උඩට ඇවිල්ලා තිබ්බා. ඒ ගැහුවේ මට පුටුවේ වාඩිවෙලා ඉද්දි මට වගේම එදා පන්තියෙ ළමයි ටික දෙනෙකුට සර් ගැහුවා. මට හරියටම මතක නැහැ ගහපු අය නම්. දිල්නුකටත් එදා සර් අතටයි පිටටයි එකක් දෙකක් ගහනවා මම දැක්කා. එයා මම ලග හිටියෙ. ඒ නිසා මම එයාට ගහන එක දැක්කා...." (සයවන ශිෂ්‍යාගේ ප්‍රකාශය)*

ඒ අනුව, පඩිපෙළ අසලදී ගුරුවරයා විසින්ම පොත් අවශ්‍ය නොවන බව පවසා, පසුව විද්‍යාගාරය තුළදී ඒ පිළිබඳවම චෝදනා කරමින් වින්දිත දිල්නුක සිසුවාට වේවැලකින් පහර දුන් බවට වන කරුණු සෙසු සිසුන්ද සඳහන් කර ඇත. මීට අමතරව, අනෙක් සිසු, සිසුවියන් සිය ප්‍රකාශ මඟින් පවසා ඇත්තේ පොත් හෝ පැවරුම් රැගෙන නොපැමිණි බව පවසමින් ඔවුන්ට ද එදින වේවැල් පහර එල්ල වූ බවත්, දිල්නුක සිසුවාට ද එලෙසම පහර දුන් බවත්ය. තවද, සිසුන්ගේ ප්‍රකාශ මඟින් අනාවරණය වන්නේ මෙම ගුරුවරයා එදින පහරදීමට අමතරව, මීට පෙර අවස්ථාවලදී ද සිසුන්ගේ කන්වලින් ඔසවා බිම තැබීම වැනි දඬුවම් පමුණුවා ඇති බවත්, එදින දිල්නුක සිසුවාගේ අතට සහ පිටට වේවැල් පහරවල් කිහිපයක් එල්ල කරන ලද්දේ පන්තියේ අනෙක් සිසුන් ඉදිරියේ බවත්ය.

04. වින්දිත දිල්නුක සිසුවා සිය පියාට, පොලිසියට සහ අධිකරණ වෛද්‍ය නිලධාරියා වෙත ලබා දී ඇති ප්‍රකාශයන් සහ සිද්ධිය ඇසින් දුටු සෙසු සිසුන් පොලිසියට ලබා දී ඇති ප්‍රකාශයන් අතර සමානාත්මතාවයක් පවතී. වින්දිත සිසුවා ලබා දී ඇති ප්‍රකාශයන් මගින් පවසා ඇත්තේ, පඩිපෙළ අසලදී පොත් අවශ්‍ය නොවන බවට ගුරුවරයා විසින්ම ලබා දුන් උපදෙසක් මත තමා විද්‍යාගාරයට ගියද, එහිදී පොත් රැගෙන නොපැමිණි බව පවසමින් කිසිදු කරුණු පැහැදිලි කිරීමකට අවස්ථාවක් ලබා නොදී ගුරුවරයා විසින් වේවැලකින් තමාට පහර දුන් බවයි. මෙම සිද්ධිය ඇසින් දුටු පන්ති කාමරයේ අනෙක් සිසුන් විසින් පොලිස් ස්ථානය වෙත ලබා දී ඇති ප්‍රකාශ මගින් ද ගුරුවරයා විසින් පොත් අවශ්‍ය නොවන බවට පඩිපෙළ අසලදී ලබා දුන් උපදෙස පිළිබඳව ද සඳහන් කර ඇත. මීට අමතරව, ප්‍රකාශයන් ලබාදුන් තවත් සිසු සිසුවියන් පස් දෙනකු විසින් ද පවසා ඇත්තේ එදින විද්‍යාගාරය තුළදී සුමිත් ගුරුවරයා වේවැලක් අතට ගෙන දිල්නුක ඇතුළු සිසුන් කිහිප දෙනෙකුටම පහර දුන් බවයි.

මෙම ප්‍රකාශයන් අධිකරණ වෛද්‍ය වාර්තාවේ සඳහන් වන වෛද්‍ය විද්‍යාත්මක නිරීක්ෂණ සමඟ මනාව අනුකූලවේ. වින්දිත සිසුවා සහ සෙසු සිසුන් පවසන පරිදි මෙය "දඬුවම් පැමිණවීම සඳහා සිදු කළ පහරදීමක්" මිස ගුරුවරයා පවසන පරිදි "අහඹු ලෙස වැදුණු එක පාරක්" නොවන බව දරුවාගේ දෙඅත්හි ස්ථාන පහක (05) දක්නට ලැබෙන රේඛීය තැලීම් මගින් සනාථ වේ. විශේෂයෙන්ම ප්‍රකාශයන් ලබාදුන් සිසුන් දිල්නුකගේ අතට සහ පිටට පහර දෙනු දැක ඇති අතර, එය දරුවාගේ දෙඅත්වල තුවාල තිබීම පිළිබඳ වෛද්‍ය වාර්තාව සමඟ සමපාතවේ. සාක්ෂිකරුවන් වන මෙම බාලවයස්කාර සිසුන් ගුරුවරයාගේ නම, සිද්ධිය වූ වේලාව (5 වන කාලච්ඡේදය), ස්ථානය (විද්‍යාගාරය) සහ පහරදීමට යොදාගත් උපකරණය (වේවැල) යන සියලු කරුණු සම්බන්ධයෙන් ස්ථාවර සහ සමාන තොරතුරු ඉදිරිපත් කිරීම තුළින්, වගඋත්තරකාර ගුරුවරයාගේ "අචේතනික පහරදීමේ" තර්කය තාර්කිකව බිඳ වැටෙන අතර, මෙය සචේතනිකව දඬුවම් කිරීම සඳහා සිදු කරන ලද පහරදීමක් බව එමගින් තහවුරු වේ.

05. පළමු වගඋත්තරකාර සුමිත් ප්‍රියන්ත ගුරුවරයා සිය ප්‍රකාශය මගින් ඉදිරිපත් කළ "අහඹු ලෙස හෝ අචේතනිකව" වේවැල් පහර වැදුණු බවට වන තර්කය, 2026.03.13 දිනැති අධිකරණ වෛද්‍ය වාර්තාව මගින් බිඳ වැටේ. වෛද්‍ය වාර්තාවට අනුව ශිෂ්‍යයාගේ වම් වැලමිට ප්‍රදේශයේ සෙ.මී. 12x0.5 සහ සෙ.මී. 10x0.5 ප්‍රමාණයේ දිගු තැලීම් දෙකක් ද, වම් බාහුවේ සහ පෙරබාහුවේ මෙන්ම දකුණු බාහුවේ ද තවත් තැලීම් පවතින බව සනාථ වී ඇත. ශරීරයේ ස්ථාන පහක (05) මෙවැනි තැලීම් ඇති වීමට නම්, මොට ආයුධයකින් කිහිප වරක්ම ප්‍රබල බලයක් යොදමින් පහර දිය යුතු බව වෛද්‍ය විද්‍යාත්මකව තහවුරු වේ. එබැවින් ගුරුවරයාගේ ප්‍රකාශයේ විශ්වාසනීයත්වය බිඳීයයි.

06. මෙම පහරදීමට පාදක වූ හේතුව ලෙස, සිද්ධිය වූ දින විද්‍යාගාරය වෙත යාමට පෙර "අද දින පෙළපොත් අවශ්‍ය නොවන බවට" පළමු වගඋත්තරකාර සුමිත් ගුරුවරයා විසින්ම උපදෙස් ලබා දුන් බව වින්දිත සිසුවා මෙන්ම සාක්ෂි ලබා දුන් සෙසු සිසුන්ගේ ප්‍රකාශ මගින් ද සනාථ වේ. ඔහු විසින්ම ලබා දුන් උපදෙසක් මත පොත් රැගෙන නොපැමිණි 11 හැවිරිදි දරුවෙකුගෙන්, විද්‍යාගාරය තුළදී "පොත කෝ" යැයි විමසමින්, කරුණු පැහැදිලි කිරීමට කිසිදු අවස්ථාවක් ලබා නොදී පහරදීම තුළින් පෙනී යන්නේ ගුරුවරයා තුළ පැවති වෘත්තීය සදාචාරයට පටහැනි අත්තනෝමතික ක්‍රියාකලාපයයි.

මෙම ක්‍රියාව හුදු ශිෂ්‍ය හික්මවීමක් ලෙස සැලකිය නොහැකි අතර, එය දරුවා පීඩාවට පත් කිරීමේ සචේතනික චේතනාවෙන් සිදු කරන ලද්දක් බව පෙනී යයි. වගඋත්තරකරු සිය නිදහසට කරුණු දක්වමින් පවසන පරිදි යම් සන්නිවේදන ගැටලුවක් එම අවස්ථාවේ පැවතියේ නම්, දරුවාට ඒ පිළිබඳ කරුණු දැක්වීමට අවස්ථාවක් හෝ ලබා දීමට ඔහු බැඳී සිටියද, එවැනි කිසිදු අවස්ථාවක් ලබා නොදුන් බව සෙසු සිසුන්ගේ සාක්ෂි මගින් තවදුරටත් සනාථ වේ. ඒ අනුව, මෙය කොටුව වැනීමේ දී ශරීරයේ වැදීමක් නොව වාර කිහිපයක්ම පහරදීමක් බවත්, එය ගුරුවරයාගේ ආවේගශීලී හා වෘත්තීය විනයෙන් බැහැර වූ ක්‍රියාවක් බවත් පෙනී යයි.

07. මෙම සිද්ධිය හුදෙකලා සිදුවීමක් නොව, පළමු වගඋත්තර සුමිත් ගුරුවරයා විසින් පන්ති කාමරය තුළ අඛණ්ඩව පවත්වාගෙන යනු ලබන ක්‍රමානුකූල දඬුවම් කිරීමේ කොටසක් බව පෙනී යයි. අම්බලන්ගොඩ පොලිස් ස්ථානය වෙත ප්‍රකාශ ලබා දුන් සිසුන් සියලු දෙනාම පාහේ එදින තමන් ද සාමූහිකව වේවැල් පහරවල්වලට ලක් වූ බව සනාථ කර ඇති අතර, ඉන් පෙනී යන්නේ ශාරීරික දඬුවම් පැමිණවීම එම ගුරුවරයාගේ සාමාන්‍ය ශිෂ්‍ය පාලන ක්‍රමවේදය වී ඇති බවයි. විශේෂයෙන්ම, මීට පෙර අවස්ථාවකදී එක් සිසුවෙකුගේ කන් දෙකෙන් ඔසවා බිමට අතහැරීම වැනි දඬුවම් පමුණුවා ඇති බවට ඉදිරිපත් වූ සාක්ෂි මඟින්, ඔහු තුළ පවතින වෘත්තීය විනයෙන් බැහැර වූ ආවේගශීලී දණ්ඩනීය ප්‍රවේශය මනාව අනාවරණය වේ.

"*අපිට නිදහසේ ඉගෙන ගන්න අමාරුයි*" යනුවෙන් සිසුවෙකු විසින් සිදු කරන ලද සංවේදී ප්‍රකාශය මඟින් ගම්‍ය වන්නේ, මෙම ගුරුවරයාගේ ඉගැන්වීම් ක්‍රමය තුළ දරුවන් මානසික පීඩනයකින් සහ භීතියකින් පසුවන බවයි. පන්ති කාමරයක් තුළ පවතින මෙවැනි වටපිටාව දරුවාගේ අධ්‍යාපන අයිතියට මෙන්ම පෞරුෂ වර්ධනයට ද බාධාවක් වේ. වගඋත්තරකරු සිය නිදහසට කරුණු ලෙස ඉදිරිපත් කරන වසර 32ක සේවා පළපුරුද්ද හෝ විභාගවලදී ලබාගෙන ඇති ඉහළ ප්‍රතිඵල, දරුවන්ට ශාරීරික හා මානසික වධහිංසා පැමිණවීම සඳහා කිසිදු නෛතික වලංගුභාවයක් හෝ සදාචාරාත්මක සාධාරණීකරණයක් ලෙස පිළිගත නොහැක.

08. දෙවන වගඋත්තරකාර පන්ති භාර ගුරුතුමිය වන සුදර්ශනී මහත්මිය සිය වෘත්තීය වගකීම් සහ සදාචාරාත්මක බැඳීම් පැහැර හැර ඇති බව නිරීක්ෂණය වේ. වසර 36ක දීර්ඝ සේවා කාලයක් සහිත, පාසලේ 6 සහ 7 ශ්‍රේණිවල අංශ ප්‍රධානී මෙන්ම උපදේශන විෂය භාර ගුරුවරියක ලෙස කටයුතු කරන ඇය, වින්දිත දරුවාගේ ශරීරයේ වූ තුවාලවල බරපතලකම අවබෝධ කරගෙන ඒ සඳහා අයිස් කැට තබා ප්‍රතිකාර කිරීමට පියවර ගෙන තිබේ. එසේ වුවද, බාලවයස්කාර දරුවෙකුට සිදු වූ එවැනි හානියක් පිළිබඳව විදුහල්පතිවරයා හෝ දෙමාපියන් දැනුවත් කිරීමට ඇය අපොහොසත් වීම මඟින් දරුවාගේ ආරක්ෂාව තහවුරු කිරීමේ මූලික වගකීම පැහැර හැර ඇත. දරුවා "එපා" කී බව පවසමින් ඇය නිහඬ වීම, උපදේශන අත්දැකීම් සහිත ජ්‍යෙෂ්ඨ ගුරුවරියකගෙන් බලාපොරොත්තු විය නොහැකි කරුණක් වන අතර, පහරදීමට යොදාගත් ප්‍රධාන භෞතික සාක්ෂිය වන "කැඩුණු වේවැල" කුණු කූඩයට දමා විනාශ කළ බව පොලිසිය වෙත ප්‍රකාශ කිරීම තුළින් ඇය මෙම සිදුවීම වසන් කිරීමට දායක වී ඇති බවට සාධාරණ සැකයක් මතු වේ.

විමර්ශන අවස්ථාවේදී ඇය විසින් දරුවාගේ ශරීර ස්වභාවය සහ පැහැය අනුව සුළු වැදීමක් වුව ද රතු පැහැයෙන් දිස්විය හැකි බව පවසමින් පහරදීමේ බරපතලකම අවම කිරීමට උත්සාහ කළ ද, ඇය විසින්ම සිද්ධියෙන් පසු දරුවාගේ පියා වෙත ලබාදුන් දුරකථන ඇමතුම්වල හඬපට සාක්ෂි මඟින් එම ප්‍රකාශය නිෂ්ප්‍රභ වේ. 2026.03.13 දින පස්වරු 16:17 ට ඇය සිදු කළ ප්‍රකාශයට අනුව, "*අත දැන් ගොඩක් ඉදිමිලා ඇති, ඒ වෙලාවෙත් අත ඉදිමිලා තිබුණේ, මටත් ඒක දැක්කාම දුකේ බෑ, හිතාගන්නත් බෑ මොකක්ද වුණේ කියලා*" යනුවෙන් ඇය සඳහන් කර ඇත. එමෙන්ම, අදාළ ගුරුවරයා විසින් අනෙකුත් දරුවන්ට සිදු කළ දඬුවම් පිළිබඳව ද ඇය දැනුවත්ව සිටි බවත්, "*ළමයෙකුගේ බෙල්ලෙන් අල්ලනවා කියන්නේ ලොකු අතකින් නේද? තව ළමයෙකුගේ ඔළුවෙන් උස්සලා බිමිනුත් තියලා... මට ඒක දැක්කාම ඇත්තටම මගේ ඇඟ වෙලුවා*" යනුවෙන් ඇය විසින්ම කළ පිළිගැනීම මඟින් මෙය පහරදීමක් බව ඇය නිවැරදිව අවබෝධ කරගෙන සිටි බව සනාථ වේ.

තවදුරටත්, දරුවාගේ "*හම පැලිලා*" තිබුණු බවත්, "*අත් දෙකම හොඳටම තුවාල වෙලා තිබුණා*" බවත් තමා සුමිත් ගුරුවරයාට ද පෙන්වා දුන් බව ඇය පවසා ඇති පසුබිමක, එවැනි හානියක් ඇසින් දුටු ගුරුවරියක ලෙස එය ඉහළ නිලධාරීන් හෝ දෙමාපියන් වෙත වාර්තා කිරීම වෙනුවට, විමර්ශන අවස්ථාවේදී ඉදිරි පියවර ගැනීම අවශ්‍ය නොවන බව පැවසීම අතිශය පරස්පර විරෝධී හැසිරීමකි. මෙම කරුණු සියල්ල සලකා බැලීමේදී, දෙවන වගඋත්තරකාරිය සිද්ධියේ බරපතලකම මනාව දැන සිටියද, වගඋත්තරකාර ගුරුවරයා ආරක්ෂා කිරීමටත්, පාසල් පාලන අධිකාරිය වෙත එල්ල විය හැකි

චෝදනා මඟහැරීමටත් සිතාමතාම කරුණු වසන් කර ඇති බවත්, ඒ තුළින් ඇය ස්ථානීය දෙමාපියෙකු ලෙස සිය නෛතික හා සදාචාරාත්මක වගකීම ඉටුකිරීමට අපොහොසත් වී ඇති බවත් පෙනී යයි.

09. විදුහල්පතිවරයා සිද්ධිය පිළිබඳව දැනුවත් වූ වහාම පන්ති භාර ගුරුවරියගෙන් කරුණු විමසා, 2026.03.13 දින සුමිත් ගුරුවරයාගෙන් කරුණු විමසා ඇත. සුමිත් ගුරුවරයා පහරදීම සම්බන්ධයෙන් සිය වරද පිළිගත් බැවින්, විදුහල්පතිවරයා ඔහුට දැඩි ලෙස අවවාද කර වහාම ක්‍රියාත්මක වන පරිදි අදාළ පන්තියේ ඉගැන්වීම් කටයුතුවලින් ඉවත් කිරීමට පියවර ගෙන ඇත. මෙම සියලු ක්‍රියාමාර්ග විද්‍යාලයේ ලොග් සටහන් පොතේ වාර්තා කර ඇති අතර, කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරිය දැනුවත් කර අදාළ ගුරුවරයා ස්ථාන මාරු කිරීමට ද නිර්දේශ කර තිබේ. කෙසේ වුවද, විද්‍යාලයේ කීර්තිනාමය සහ පාසල් ප්‍රජාවේ මානසිකත්වය සැලකිල්ලට ගෙන, මෙම ගැටලුව සුහදව නිරාකරණය කරගැනීමට පවතින හැකියාව පිළිබඳව ද විදුහල්පතිවරයා විමර්ශන අවස්ථාවේ දී යෝජනා කර ඇත.එමඟින් ඔහු මේ සම්බන්දයෙන් දක්වන ලිහිල් ප්‍රතිපත්තිය ද පෙනී යයි.

10. පොලිස් ස්ථානය වෙත සෙසු සිසුන්ගේ දෙමාපියන් ලබා දී ඇති ප්‍රකාශයන් මගින් ශිෂ්‍ය හිංසනය පිළිබඳ සමාජයේ පවතින දුර්මතයන් නිරීක්ෂණය වේ. *"දරුවන් හදා ගන්න දඬුවම් කළාට කමක් නැත"* යන ඇතැම් දෙමාපියන්ගේ ස්ථාවරය මගින් ගුරුවරයාගේ ප්‍රචණ්ඩත්වය සාධාරණීකරණය කළ නොහැක. වින්දිත දරුවා රෝහල් ගත කිරීමට තරම් හානියක් සිදු වී ඇති අතර, එය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 11 වන වගන්තිය යටතේ සහතික කර ඇති "වධහිංසාවෙන් නිදහස් වීමේ" මූලික අයිතිවාසිකම උල්ලංඝනය කිරීමකි. පැමිණිලිකරු ඉදිරිපත් කළ දුරකථන හඬපට, JMO වාර්තාව සහ ඇසින් දුටු සාක්ෂිකරුවන්ගේ ප්‍රකාශ යන සියල්ලම එකිනෙකට අනුකූල වන අතර, ඒවා පළමු වගඋත්තරකරුගේ නිදහසට කරුණු තාර්කිකව නිෂ්ප්‍රභ කරයි.

11. ගා/පී. ද එස්. කුලරත්න විද්‍යාලයේ 7-ඩී ශ්‍රේණියේ ඉගෙනුම ලබන දිල්නුක යන 11 හැවිරිදි ශිෂ්‍යයාට, 2026.03.12 වන දින විද්‍යාගාරය තුළදී විද්‍යා ගුරුවරයා විසින් සිදු කරන ලද මෙම පහරදීම හුදෙක් ශාරීරික වේදනාවකට පමණක් සීමා වූවක් නොවේ. එය දරුවෙකුගේ මනසට සහ පෞරුෂයට සිදු කරනු ලැබූ බරපතල මෙන්ම අතිශය සංවේදී හානියකි. රෝහල් වාර්තාවලින් තහවුරු වන ශාරීරික තුවාල සුව වුව ද, තම පන්ති කාමරය තුළ සමවයස් සිසුන් ඉදිරියේ විඳීමට සිදු වූ මෙම අවමානය සහ පීඩාව දරුවාගේ මනස තුළ නොමැකෙන කැළලක් ඇති කරන අතර, එය ඔහුගේ අනාගත පෞරුෂ වර්ධනයට ද බාධාවක් විය හැකිය. යහපත් වැඩිහිටියෙකු නිර්මාණය වීමේ මූලික පදනම සැකසෙන්නේ සුරක්ෂිත ළමා අවධියක් තුළින් වන බැවින්, දරුවෙකුගේ ආත්ම අභිමානය උල්ලංඝනය වන මෙවැනි ක්‍රියාවල බැරෑරුම්කම කිසිසේත් අවතක්සේරු කළ නොහැක.

12. 1995 අංක 22 දරන දණ්ඩ නීති සංග්‍රහය (සංශෝධන) පනතේ 308 (අ) වගන්තිය ප්‍රකාරව ළමයින් කෲරත්වයට භාජනය කිරීම දණ්ඩනීය වරදක් වන අතර, ළමා අයිතිවාසිකම් පිළිබඳ විශ්ව ප්‍රඥප්තියේ (UNCRC) සහ දණ්ඩ නීති සංග්‍රහයේ 311 (ඇ) වගන්තියට අනුව වයස අවුරුදු 11ක් වන වින්දිත දිල්නුක වින්දිව් දරුවා සියලුම දේශීය හා ජාත්‍යන්තර නෛතික ආරක්ෂාවන් ලැබීමට පූර්ණ හිමිකම් සහිත "ළමයෙකු" වේ. ශ්‍රී ලංකාව විසින් අත්සන් තබා ඇති UNCRC සම්මුතියේ 28(2) වගන්තිය සහ 19 වන වගන්තිය මඟින් අවධාරණය කර ඇති පරිදි, පාසල් විනය පාලනය සෑම විටම දරුවාගේ ගෞරවයට අනුකූල විය යුතුය. මෙම ජාත්‍යන්තර මූලධර්මය උල්ලංඝනය කරමින්, වගඋත්තරකාර සුමිත් ප්‍රියන්ත ගුරුවරයා විසින් දරුවාගේ ශරීරයේ ස්ථාන පහක (05) තැලීම් සලකුණු ඇති වන පරිදි වේවැල් පහර එල්ල කිරීම මඟින් දරුවා කෲරත්වයට පත් කර ඇති බව වෛද්‍ය සාක්ෂි මත සනාථ වේ.

13. අධ්‍යාපන අමාත්‍යාංශයේ අංක 2012/37 දරන චක්‍රලේඛයට අනුව, ගුරුවරයෙකු පාසල තුළදී 'ස්ථානීය දෙමාපියන්' (In Loco Parentis) නීතිමය සංකල්පයට අනුව දරුවාගේ සුබසිද්ධිය ආරක්ෂා කිරීමට බැඳී සිටී. එහෙත් පළමු වගඋත්තර විද්‍යා විෂය භාර ගුරුවරයා සහ පන්තිභාර ගුරුවරිය එම සදාචාරාත්මක වගකීම පැහැර හැර ඇත. තවද, පාසල් තුළ ශාරීරික දඬුවම් තහනම් කරමින් නිකුත් කර

ඇති අංක 12/2016 දරන චක්‍රලේඛය උල්ලංඝනය කරමින්, 'වේවැලක්' භාවිතා කර දරුවාට පහර දීම මගින් ඔහු උක්ත නියෝග නොසලකා හැර තිබේ. "සද්භාවයෙන් යුතුව දඬුවම් කළා" යන්න මෙවැනි ප්‍රචණ්ඩකාරී පහරදීමකදී සාධාරණීකරණයක් ලෙස පිළිගත නොහැක.

14. ශ්‍රී ලංකා ශ්‍රේෂ්ඨාධිකරණයේ පූර්වාදර්ශයන් මෙම සිදුවීමට සෘජුවම අදාළ වේ. ***ආර්.එම්. ලලිත බණ්ඩාර සහ තවත් අය එදිරිව රම්‍යා ද සිල්වා (SC/FR 461/2012) සහ හේවා මද්දුමගේ කරුණාපාල එදිරිව ඒ. ජයන්ත ප්‍රේම කුමාර සිරිවර්ධන (SC FR /97/2017)*** යන නඩු තීන්දු මඟින් අධිකරණය ප්‍රකාශ කර ඇත්තේ, කිසිදු හේතුවක් මත සිසුවෙකුට ශාරීරික දඬුවම් පැමිණවීම "විනය පාලනයක්" ලෙස පිළිගත නොහැකි බවත්, එය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 11 වන වගන්තිය මඟින් සහතික කර ඇති මූලික අයිතිවාසිකම් උල්ලංඝනය කිරීමක් බවත්ය. මෙම පැමිණිල්ලේදී ද, වින්දිත සිසුවාගේ ශරීරයේ දක්නට ලැබුණු තැලීම් පහරවල් සහ එමගින් ඇති වූ මානසික කම්පනය, ව්‍යවස්ථාවෙන් සහතික කර ඇති 'වධහිංසාවෙන් නිදහස් වීමේ අයිතිය' උල්ලංඝනය කිරීමක් බව සනාථ වේ.

15. එමෙන්ම, ***විජේසිංහ චූලංගනී එදිරිව වරුණි බෝගහවත්ත (SC FR App No. 677/2012)*** නඩුවේදී පෙන්වා දුන් පරිදි, බාලවයස්කාර දරුවෙකුට එල්ල වන අවමන් සහගත සැලකීමකදී 'බරපතල හිංසන මට්ටම' තීරණය කළ යුත්තේ දරුවාගේ මානසිකත්වය හා වර්ධනය කෙරෙහි ඇති වන බලපෑම සලකා බලමිනි. වින්දිත දරුවාට එල්ල වූ පහරදීම, සෙසු සිසුන් ඉදිරියේ සිදු වීමත්, ඉන් පසුව ඔහු රෝහල් ගත කිරීමට සිදු වීමත් තුළින් පෙනී යන්නේ ඔහුගේ ආත්ම අභිමානයට සහ මානසිකත්වයට හානියක් සිදුව ඇති බවයි. ***පරාක්‍රමගේ ඩග්ලස් බණ්ඩාර එදිරිව එස්. වික්‍රමසිංහ (SC Application No. 190/94)*** තීන්දුව ප්‍රකාරව, වගඋත්තරකාර ගුරුවරයා රාජ්‍ය නිල බලය යටතේ ක්‍රියා කළ අයෙකු බැවින්, ඔහු සිදු කළ මෙම හිංසනය සඳහා රජය සහ ඔහු පෞද්ගලිකව වගකීමට බැඳී සිටියි.

**16.** සමස්තයක් ලෙස ගත් කල, අනාවරණය වූ සාක්ෂි සහ වෛද්‍ය වාර්තා මත පදනම්ව, පළමුවන වගඋත්තරකාර සුමිත් ප්‍රියන්ත හෙන්දහේවා ගුරුවරයා විසින් වින්දිත දිල්නුක පීරිස් සිසුවාගේ ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 11 වන ව්‍යවස්ථාව යටතේ සහතික කර ඇති මූලික අයිතිවාසිකම් උල්ලංඝනය කර ඇති බවත්, දෙවන වගඋත්තරකාරිය මීට පූර්වයෙන් ද මෙම ගුරුවරයා විසින් සිසුන්ට පහරදීම් සිදු කරන බව දැනුවත්ව සිටියද එය වැළැක්වීමට කටයුතු නොකිරීම හා මෙම සිදුවීම වසන් කිරීමට මෙන්ම පන්තිභාර ගුරුවරියක ලෙස සිය ස්ථානීය දෙමාපිය වගකීම නිසි අයුරින් ඉටු කිරීමට අසමත්වී ඇති බව නිරීක්ෂණය වේ.

**නිගමනය**

පළමුවන වගඋත්තරකාර සුමිත් ප්‍රියන්ත හෙන්දහේවා ගුරුවරයා විසින් මෙම පහරදීම "අචේතනිකව" හෝ "අහඹු ලෙස" සිදුවූවක් බව පැවසීමට උත්සාහ කළද, අධිකරණ වෛද්‍ය වාර්තාව මඟින් තහවුරු කර ඇති බහුවිධ තුවාල රටාව සහ පන්ති කාමරයේ සෙසු සිසුන්ගේ සමපාත සාක්ෂි මඟින් මෙය චේතනාන්විතව සහ ප්‍රබල බලයක් යොදා සිදු කරන ලද පහරදීමක් බව සනාථ වේ. කළුගල දිල්නුක වින්දිව් පීරිස් යන 11 හැවිරිදි වින්දිත සිසුවාගේ ශරීරයේ ස්ථාන පහක (05) තැලීම් සලකුණු ඇති වන පරිදි වේවැල් පහර එල්ල කිරීම අධිකරණ වෛද්‍ය වාර්තාව මඟින් තහවුරු කර ඇත. දරුවාගේ දෑත්වල සහ වැලමිට ප්‍රදේශයේ දක්නට ලැබෙන සෙ.මී. 12 සහ 10 තරම් වූ දිගු රේඛීය තැලීම් සලකුණු මඟින් ගම්‍ය වන්නේ මෙය වේවැල වැනීමේ දී අහඹුලෙස වැදීමක් නොව, හිතාමතා කරන ලද දඬුවමක් බවයි.

තවද, එක්සත් ජාතීන්ගේ ළමා අයිතිවාසිකම් පිළිබඳ සම්මුතියට (UNCRC) අනුකූලව, සෑම දරුවෙකුටම සියලු ආකාරයේ ප්‍රචණ්ඩත්වයෙන් සහ වධහිංසාවෙන් ආරක්ෂා වීමට ඇති අයිතිය මෙම ගුරුවරයාගේ ක්‍රියාකලාපය හේතුවෙන් අහිමි වී ඇත. අධ්‍යාපන අමාත්‍යාංශය විසින් නිකුත් කර ඇති

අංක 12/2016, 2012/37 සහ 11/2026 දරන චක්‍රලේඛ මඟින් පාසල් පද්ධතිය තුළ ශාරීරික දඬුවම් පැමිණවීම සම්පූර්ණයෙන්ම තහනම් කර ඇති පසුබිමක, පළමු වගඋත්තරකරු විසින් එම නිල නියෝගයන් සහ වෘත්තීය ආචාර ධර්මයන් නොසලකා හරිමින් කටයුතු කර තිබේ. සිසුවා තුළ චර්යාමය වෙනසක් ඇති කිරීමේ චේතනාවෙන්, සද්භාවයෙන් යුතුව වුව ද, කිසිදු ශිෂ්‍යයෙකුට ශාරීරික හෝ මානසික පීඩාවක් විය හැකි ආකාරයේ දඬුවම් ලබාදීමෙන් ගුරුවරුන් වැළකී සිටිය යුතු බවට පවතින නෛතික ප්‍රතිපාදන වගඋත්තරකරු විසින් මෙහිදී උල්ලංඝනය කර ඇත.

මෙම ක්‍රියාව 1995 අංක 22 දරන දණ්ඩ නීති සංග්‍රහය (සංශෝධන) පනතේ 308 (අ) වගන්තිය යටතේ දැක්වෙන "ළමයින් කෲරත්වයට භාජනය කිරීමේ" දණ්ඩනීය වරදක් වන අතර, <u>*ඊ.එම්. ලලිත බණ්ඩාර එදිරිව රම්‍යා ද සිල්වා (SC/FR 461/2012) සහ හේවා මද්දුමගේ කරුණාපාල එදිරිව ඒ. ජයන්ත ප්‍රේම කුමාර සිරිවර්ධන (SC FR /97/2017)*</u> යන නඩු තීන්දු මඟින් ලබා දී ඇති නෛතික පූර්වාදර්ශයන් ප්‍රකාරව, විනය පාලනය කිරීමේ මුවාවෙන් සිසුවෙකුට ශාරීරික දඬුවම් පැමිණවීම කිසිදු අයුරකින් නීතියෙන් අනුමත කළ නොහැකි බවත්, එය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 11 වන වගන්තිය උල්ලංඝනය කිරීමක් බවත් පැහැදිලිවම පෙන්වා දී ඇත.

ඒ අනුව, ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ **11 වන ව්‍යවස්ථාව** මඟින් **"කිසිම තැනැත්තෙකු වධහිංසාවලට හෝ කෲර, අමානුෂික හෝ අවමන් සහගත සැලකිල්ලකට හෝ දඬුවමකට යටත් නොකළ යුත්තේය"** යනුවෙන් වින්දිත දරුවා වෙත සහතික කර ඇති මූලික අයිතිවාසිකම, පළමු වගඋත්තරකාර සුමිත් ප්‍රියන්ත හෙන්දහේවා ගුරුවරයා විසින් උල්ලංඝනය කර ඇති බව මෙයින් නිගමනය කරමි.

දෙවන වගඋත්තරකාර පන්ති භාර ගුරුතුමිය වන එච්.ඒ. රේණුකා සුදර්ශනී මහත්මිය සිය වෘත්තීය වගකීම් සහ සදාචාරාත්මක බැඳීම් පැහැර හැර ඇති බව නිරීක්ෂණය වේ. වසර 36ක දීර්ඝ සේවා කාලයක් සහිත, පාසලේ 6 සහ 7 ශ්‍රේණිවල අංශ ප්‍රධානී මෙන්ම ශිෂ්‍ය උපදේශන විෂය භාර ගුරුවරියක ලෙස කටයුතු කරන ඇය, වින්දිත දරුවාගේ ශරීරයේ වූ තැලීම් සහ ඉදිමුම් තුවාල ඇසින් දැක, ඒ සඳහා අයිස් කැට තබා ප්‍රථමාධාර ලබා දීමට කටයුතු කර ඇත. එවැනි හානියක් පිළිබඳව විදුහල්පතිවරයා හෝ දෙමාපියන් දැනුවත් කිරීමට බැඳී සිටියද, 11 හැවිරිදි බාලවයස්කාර දරුවෙකු "එපා" කී බව පවසමින් ඇය නිහඬ වීම, දරුවාගේ ආරක්ෂාව තහවුරු කිරීමේ මූලික වගකීම නොකර හැරීමකි.

විමර්ශනයේදී අනාවරණය වූ කරුණු අනුව, පහරදීමට යොදාගත් ප්‍රධාන භෞතික සාක්ෂිය වන "කැඩුණු වේවැල" විනාශ වීමට ඉඩ හැරීම හෝ එය කුණු කූඩයට දැමූ බව පැවසීම තුළින් ඇය සිතාමතාම සාක්ෂි වසන් කිරීමට දායක වී ඇති බව පෙනී යයි. තවද, ඇය විමර්ශන අවස්ථාවේදී දරුවාගේ ශරීර ස්වභාවය අනුව සුළු වැදීමක් පවා රතු වී පෙනෙන බව පවසමින් සිද්ධියේ බරපතලකම අවම කිරීමට උත්සාහ කළ ද, ඇය විසින්ම දරුවාගේ පියා වෙත ලබාදුන් දුරකථන හඬපටවල *"දරුවාගේ අත පුපුරලා තිබුණා, හම පැලිලා තිබුණා, මට ඒක දැක්කාම ඇඟ වෙලුවා"* යනුවෙන් සිදු කළ පිළිගැනීම් මඟින් ඇය සිතාමතාම සත්‍ය වසන් කර ඇති බව සනාථ වේ. අධ්‍යාපන අමාත්‍යාංශයේ අංක 2012/37 දරන චක්‍රලේඛය ප්‍රකාරව ගුරුවරයෙකු සතු "ස්ථානීය දෙමාපිය" වගකීම ඇය විසින් මෙහිදී උල්ලංඝනය කර ඇත. ඒ අනුව, වින්දිත දිල්නුක පීරිස් සිසුවාට ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ **12(1) ව්‍යවස්ථාව** මඟින් සහතික කර ඇති **"නීතිය පසිඳලීමේදී සමානත්වයට ඇති අයිතිය සහ නීතියේ සමාන රැකවරණය ලැබීමට ඇති අයිතිය"** ඇය විසින් උල්ලංඝනය කර ඇති බව මෙයින් නිගමනය කරමි.

තෙවන වගඋත්තරකාර විදුහල්පතිවරයා, සිද්ධිය වාර්තා වූ වහාම ඔහු විසින් ගනු ලැබූ ක්‍රියාමාර්ග පිළිබඳව අවධානය යොමු කිරීමේ දී, වගඋත්තරකාර ගුරුවරයාව වහාම ක්‍රියාත්මක වන පරිදි අදාළ පන්තියේ ඉගැන්වීම් කටයුතුවලින් ඉවත් කිරීමට පියවර ගැනීම සහ මේ පිළිබඳව කලාප අධ්‍යාපන කාර්යාලය වෙත තොරතුරු වාර්තා කර ඉදිරි ක්‍රියාමාර්ග සඳහා මඟපෙන්වීම තුළින් ඔහු සාධනීය පරිපාලනමය මැදිහත්වීමක් සිදු කර ඇති බව තහවුරු වේ. මෙම සාධනීය මැදිහත්වීම සැලකිල්ලට

ගනිමින්, තෙවන වගඋත්තරකාර විදුහල්පතිවරයා මූලික අයිතිවාසිකම් උල්ලංඝනය කිරීමේ වගකීමට යටත් නොකිරීමට තීරණය කරන ලදී.

සිව්වන වගඋත්තරකාර අම්බලන්ගොඩ කලාප අධ්‍යාපන කාර්යාලය, මෙම පැමිණිල්ලට පාදක වූ සිදුවීම වාර්තා වූ වහාම අදාළ ගුරුවරයාව වෙනත් පාසලක් වෙත ස්ථාන මාරු කිරීමට පියවර ගැනීම සහ දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව මඟින් පවත්වනු ලබන මූලික විමර්ශන කටයුතු සඳහා අවශ්‍ය පූර්ණ සහයෝගය ලබාදීම මඟින් ඔවුන් සිය පරිපාලනමය වගකීම නිසි පරිදි ඉටු කර ඇති බව නිරීක්ෂණය වේ. කලාප අධ්‍යාපන කාර්යාලය විසින් සිදු කරන ලද මෙම සාධනීය මැදිහත්වීම මත , සිව්වන වගඋත්තරකරු මූලික අයිතිවාසිකම් උල්ලංඝනය කිරීමේ වගකීමට යටත් නොකිරීමට තීරණය කරන ලදී.

පස්වන වගඋත්තරකාර අම්බලන්ගොඩ කාන්තා හා ළමා කාර්යාංශයේ පොලිස් ස්ථානාධිපතිවරයා, පැමිණිල්ල වාර්තා වූ අවස්ථාවේ සිටම වින්දිත පාර්ශවයේ ප්‍රකාශ සටහන් කරගනිමින් සහ විධිමත් විමර්ශනයක් පවත්වමින් කරුණු බලපිටිය මහේස්ත්‍රාත් අධිකරණය වෙත වාර්තා කර නෛතික ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරීමට පියවර ගෙන ඇත. සිද්ධියට අදාළව නීතිය ක්‍රියාත්මක කිරීමේ ව්‍යවස්ථාපිත වගකීම පස්වන වගඋත්තරකරු විසින් ඉටු කර ඇති බැවින්, පස්වන වගඋත්තරකරු මූලික අයිතිවාසිකම් උල්ලංඝනය කිරීමේ වගකීමට යටත් නොකිරීමට තීරණය කරනු ලැබේ.

**නිර්දේශ සඳහා යෝජනා**

01. පළමුවන වගඋත්තරකාර සුමිත් ප්‍රියන්ත හෙන්දහේවා ගුරුවරයා විසින් වින්දිතට රුපියල් 25,000/- ක වන්දි මුදල 'මුදල් ඇණවුමක්' (Money Order) මඟින් වින්දිත පාර්ශවය වෙත ගෙවීමට කටයුතු කළ යුතු අතර, එම මුදල් ඇණවුමේ පිටපතක් මෙම කොමිෂන් සභාව වෙත ලැබීමට සැලැස්විය යුතුය

02. පළමුවන වගඋත්තරකාර සුමිත් ප්‍රියන්ත හෙන්දහේවා ගුරුවරයා විසින් ශිෂ්‍යයාට පහර දී තුවාල සිදු කිරීම සහ අධ්‍යාපන අමාත්‍යාංශය විසින් පනවා ඇති චක්‍රලේඛ විධිවිධාන උල්ලංඝනය කිරීම සම්බන්ධයෙන්, පරීක්ෂණයක් පවත්වා සුදුසු පියවර අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්වරයා ගත යුතුය.

03. දෙවන වගඋත්තරකාර පන්ති භාර ගුරුවරිය වන සුදර්ශනී මහත්මිය, මෙම සිද්ධියේදී දක්වන ලද වෘත්තීය නොසලකා හැරීම, සහකම්පනයකින් තොරව කටයුතු කිරීම සහ දරුවාගේ උපරිම යහපත තහවුරු කිරීමට අපොහොසත් වෙමින් සාක්ෂි වසන් වීමට ඉඩ හැරීම සම්බන්ධයෙන් අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් විමර්ශනයක් පවත්වා සුදුසු පියවර ගත යුතුය.

04. හතරවන වගඋත්තරකරු මෙම සිදුවීම සම්බන්ධයෙන් දණ්ඩ නීති සංග්‍රහයේ 308 (අ) වගන්තිය යටතේ විධිමත් අවධානයකින් යුතුව නඩුව පවත්වාගෙන යාමට ක්‍රියාකළ යුතුය.

05. පාසල් පද්ධතිය තුළ ශාරීරික දඬුවම් පැමිණවීමේ ක්‍රියාවලිය ඉවත් කිරීම සහ සිසුන්ගේ ගරුත්වය සුරක්ෂිත කිරීම උදෙසා, අධ්‍යාපන අමාත්‍යාංශය මඟින් නිකුත් කර ඇති අංක 12/2016, 2012/37 සහ 11/2026 යන චක්‍රලේඛයන්හි අන්තර්ගතය සහ විධිවිධාන පිළිබඳව පාසලේ සමස්ත ගුරු මණ්ඩලය, පරිපාලන නිලධාරීන් දැනුවත් කිරීමේ විධිමත් වැඩසටහන් මාලාවක් අම්බලන්ගොඩ කලාප අධ්‍යාපන කාර්යාලයේ මැදිහත්වීමෙන් පැවැත්විය යුතුය.

2026.07.30 දින පෙර මෙකී නිර්දේශ ක්‍රියාත්මක කර ඒ සම්බන්ධයෙන් වාර්තාවක් කොමිෂන් සභාවට ලැබීමට සලස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 15 (7) වගන්තිය ප්‍රකාරව වගඋත්තරකරුවන් වෙත දන්වමු.

එසේම එකී නිර්දේශ ක්‍රියාත්මක කර ඉදිරිපත් කිරීමට නියමිත දින සිට සතියක කාලයක් තුළ මෙම නිර්දේශ ක්‍රියාත්මකවීම හෝ නොවීම සම්බන්ධව පැමිණිලිකරු විසින් ද කොමිෂන් සභාවට දැනුම්දිය යුතු වන අතර, එදිනට පෙර අදාළ දැනුම්දීම සිදු නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් සලකා නොබලන බව ද වැඩිදුරටත් දන්වමු.

| | |
|---|---|
| එල්.ටී.බී. දෙහිදෙණිය,<br>ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු (හිටපු),<br>සභාපති,<br>ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.<br>විනිසුරු එල්.ටී.බී.දෙහිදෙණිය<br>ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු (විශ්‍රාමික)<br>සභාපති<br>ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව | නිමල් ජී. පුංචිහේවා,<br>ජ්‍යෙෂ්ඨ නීතිඥ,<br>කොමසාරිස්,<br>ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.<br>නිමල් ජී. පුංචිහේවා<br>ජ්‍යෙෂ්ඨ නීතිඥ<br>කොමසාරිස්<br>ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව |

පිටපත

1. අමාත්‍යතුමිය - කරුණු දැන ගැනීම සඳහා
   අධ්‍යාපන අමාත්‍යාංශය
   ඉසුරුපාය
   බත්තරමුල්ල.

2. ලේකම් - නිර්දේශ ප්‍රකාරව සුදුසු පියවර ගැනීම සඳහා
   අධ්‍යාපන අමාත්‍යාංශය
   ඉසුරුපාය
   බත්තරමුල්ල.

3. අධ්‍යක්ෂ - නිර්දේශ ප්‍රකාරව සුදුසු පියවර ගැනීම සඳහා
   කලාප අධ්‍යාපන කාර්යාලය
   අම්බලන්ගොඩ.